**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)**
**අගෝස්තු 2018**
FIRST YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL NEW SYLLABUS) AGUST 2018

BPHE 101: ප්‍රාග් බෞද්ධ දාර්ශනික පසුබිම

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. භාරතයේ ප්‍රාග් බෞද්ධ අවදියේ දී දාර්ශනික සංකල්ප ක්‍රමයෙන් වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

2. "බුදු දහමේ පහළවීම සමකාලීන ආගමික හා දාර්ශනික දෘෂ්ටිවලට විචාරපූර්වක ප්‍රතිචාරයක් විය." සාකච්ඡා කරන්න.

3. ප්‍රාග් බෞද්ධ යුගයේ සිට කර්ම සංකල්පයේ සංවර්ධනය පරීක්ෂාවට ලක් කරන්න.

4. "වෛදික යුගයේ අග්නි දෙවියන් උදෙසා යාගහෝම පැවැත්වීම ක්‍රමයෙන් දියුණු වී බෞද්ධ ශිෂ්ටාචාරය තුළ දී දානමය කුසලක්‍රියාව බවට පත් විය." විචාරයට ලක් කරන්න.

5. ප්‍රාග් බෞද්ධ හා බෞද්ධ ඉගැන්වීම්වල නිරූපිත හේතු ඵල සිද්ධාන්තය සම්බන්ධ අර්ථකථනයන්හි මූලික වෙනස්කම් පිටකාගත සූත්‍ර දේශනා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

6. කාලයාගේ ඇවෑමෙන් බහුදේවවාදය ඒකදේවවාදයට හැරුණු ආකාරය පැහැදිලි කොට බෞද්ධ දෘෂ්ටි කෝණයෙන් ඒවා විචාරයට ලක් කරන්න.

7. උපනිෂද් හා බෞද්ධ ඉගැන්වීම්වල විමුක්ති සංකල්පයන්හි වෙනස්කම් පහදා දෙන්න.

8. වෛදික යුගයේ දී හඳුන්වා දෙන ලද කුලක්‍රමය හා ඒ පිළිබඳ බුදුන් වහන්සේගේ විවේචනය විමසුමට ලක් කරන්න.

9. ජෛන මහාවීරයන්ගේ හා බුදුන් වහන්සේගේ චරිතයන්හි හා ප්‍රධාන ඉගැන්වීම්වල සමවිෂමතා පෙන්වා දෙන්න.

10. "බෞද්ධ සූත්‍ර දේශනාවල දැක්වෙන දස වැදෑරුම් අව්‍යාකෘත ප්‍රශ්න පාරභෞතික දෘෂ්ටි කෙරෙහි සමකාලීන සමාජයේ රුචිකත්වය කෙතෙක් දුරට නැඹුරු වී තිබුණිදැයි හෙළි කරයි." සාකච්ඡා කරන්න.

==========